RARE

# ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයන්හි ඇති නිර්මාණාත්මක හා සංස්කෘතික ලක්ෂණ

## ගාල්ල හා කෑගල්ල දිස්ත්‍රික්කවලට විශේෂිතව කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයකි

එම්. එම්. ඩී. සේනාධීර

FGS/M/MSSC/2006/39

සමාජීය විද්‍යාපති උපාධිය (MSSC)



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1246 |
| වර්ග අංකය: | |



සමාජීය විද්‍යාපති - ජනසන්නිවේදනය

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

2015 මාර්තු

## සංක්ෂේපය

ලෝකයේ ජීවත් වන ජනතාව තම සන්නිවේදන අවශ්‍යතා සඳහා කුමන හෝ භාෂාවක් කතා කරති. මානව වර්ගයාට අයත් නොවන පිලොපිතිකස් වානරයාගේ සිට නූතන හෝමෝසේපියන්ස් මානව පරිණාම අවස්ථාව දක්වා ක්‍රමික ව විකාශය වූ භාෂාව, භූගෝලීය පසුබිම, කලාපීය, පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය වශයෙන් මෙන් ම ජන ඝනත්වය පාදක කර ගනිමින් වෙනස් වූ අතර වචන, උච්චාරණ විලාසය, භාවිත කරන උපමා රූපකවලට අනුව විවිධ වෙනස්කම් හා භාෂා ශෛලීන් එහි දැකිය හැකි වේ. ශ්‍රී ලංකාවට ද මෙය පොදු කාරණයක් වන අතර ඒ සම්බන්ධයෙන් පර්යේෂණ නිබන්ධ රචනා කර ඇත්තේ අතලොස්සක් පමණි.

ප්‍රාදේශීය භාෂාව හෙවත් සමාජ උප භාෂා සමාජයෙන් ඈත් වන්නට හේතුවක් වන්නේ ලිඛිත භාෂාවෙහි භාවිත නොවන කට වහර තුළ පමණක් භාවිත වන ව්‍යවහාරයන් බැවිනි. එය ඉස්මතු කර ගැනීමේ එක් මාර්ගයක් වනුයේ ජනශ්‍රැතිය අධ්‍යයනය කිරීම යි. එමඟින් මුඛ පරම්පරාගත සාහිත්‍යය, භෞතික සංස්කෘතිය, ජන සමාජ චාරිත්‍ර හා ප්‍රයුංජන කලා ශිල්ප යන විෂයයන් හතර ආවරණය කරන අතර සංස්කෘතිය තුළ අන්තර්ගත සිතුම් පැතුම්, චර්යා ධර්ම, වත් පිළිවෙත්, ඇදහිලි, මිත්‍යා විශ්වාස, අභිචාර විධි යන සියලු ම සංස්කෘතිකාංග ජන වහර තුළ අන්තර්ගත වී ඇත.

එම සංස්කෘතියට අයත් සාධක හතර මඟින් සිතෙහි තැන්පත් වූ ඇදහිල හා විශ්වාස (අභිචාර විධි) මුඛ පරම්පරාගත සාහිත්‍යයටත්, බස්වහර, ජන කතා, ජන කවි, සාම්ප්‍රදායික කියමන්, ඉඟිවැකි, උපමා, ප්‍රස්ථාපිරුළු, මුඛ පරම්පරාගත ජන සාහිත්‍යටත් අයත් වේ.

ඒ අනුව භාෂාව පෝෂණය කරන පැරැණි ඥාන දායාද නව පරපුරට රැගෙන එන මුඛ පරම්පරාගත සාහිත්‍යයත් මුඛ පරම්පරාගත ජන සාහිත්‍යයත් අධ්‍යයනය කළ යුතු වේ.

නූතන ලෝකයේ විවිධ විශ්වවිද්‍යාල ජනශ්‍රැතිය හා ජන ජීවිත පිළිබඳ අධ්‍යයනය කළ ද ඊට සාපේක්ෂ ව ලංකාවේ ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර සහ ඒවායේ ඇති සංස්කෘතික හා නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයන කළ යුතු වන්නේ සමාජ ජන ජීවිතය හා බැඳී ඇති හර පද්ධතීන් ඉදිරි පරම්පරාවට රැගෙන යාමට ය. ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සහ පාසල් විෂය නිර්දේශයට ඇතුළත් විෂයයක් ලෙස මෙය ඉගැන්වීම අද වන විට අත්‍යවශ්‍යව ඇත.

පරිසරයේ ඇති සතා සිව්පාවා, ගහ කොළ වැනි ජීව වස්තූන් සහ අහස, පොළොව, ඉරහඳ තාරකා වැනි අජීවී වස්තු පාදක කර ගනිමින් සුබ අසුබ තත්ත්වයන් පිළිබඳ බැඳුණු ජනශ්‍රැතිකාංග මෙහිදී විමසුමට බඳුන් වී ඇත.

ඒ අනුව ගාල්ල සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකෙහි භාවිත වන ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයන්හි ඇති නිර්මාණාත්මක සහ සංස්කෘතික ලක්ෂණ විමර්ශනයට ලක් කිරීමත් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් මෙවැනි පර්යේෂණවලට පෙලඹවීමත් අරමුණු කර ගනිමින් මේ පර්යේෂණය සිදු කර ඇත.



ඉඟි පද - "සන්නිවේදනය", "සංස්කෘතිය", "ජනශ්‍රැතිය", "ප්‍රාදේශීය උපභාෂාව", "වාග් විද්‍යාව"

## Abstract

People in the world use a language to fulfil their communication needs. Language, which evolved from Plopithecus ape to modern Homo Sapiens, differs based on geographical background, zone, province, district, region as well as population density and various diversities and styles could be obtained in words, articulation and similes and metaphors. This is also common to Sri Lanka, and only a few researches have done in this regard so far.

Reason for social dialects to be detached from the society is that they could be only observed in spoken language rather than in written forms. One of the ways to reveal it, is to study the folklore. It covers the study of oral literature, material culture, social folk customs and performing folk arts and all cultural elements which are the way of thinking, behaviours, rituals, beliefs, superstitions and magic are included in folklore.

In these four aspects of the culture, beliefs (rituals) belong to oral literature and language, folk stories, folk poetry, traditional sayings, idioms, metaphors, and proverbs belong to oral folk literature.

Hence, the oral literature, and oral folk literature, which brings the knowledge that nurtures the language of older generations to the new generation, should be studied.

Though various universities in the world undertake studies on folklore and folk lifestyle, regional dialects of Sri Lanka and their cultural and creative features should be studied to transfer values bound with them to the future generation. It has become essential today to teach this subject within the Sri Lankan university system and in school curriculum.

Elements in folklore bound with good and evil aspects of animate objects in the environment such as fauna and flora as well as inanimate objects such as the sky, earth, sun, moon and stars have been analysed in this thesis.

Accordingly, this research is done with the objectives of analysing creative and cultural features of regional dialects used in Galle and Kegalle Districts and inspiring university scholars in such researches.

Keywords - **"Communication", Culture", "Folklore", "Regional dialect", "Linguistics"**